C

# නිවේදනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කරන ලද "ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව" නමැති පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

පනත් කෙටුම්පතෙහි–

(i) සභාවෙහි ඉංජිනේරු කාර්මිකයින් නම් කිරීම 3(ආ) වගන්තිය යටතේ මගහැරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට අනනුකූල බවට ද;

(ii) 41 වගන්තියේ සඳහන් පරිදි සියලු කාණ්ඩවල "ඉංජිනේරු වෘත්තිකයන්"ගේ සාධාරණ නියෝජනයක් නම් කිරීමට අපොහොසත් වීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 12(2) ව්‍යවස්ථාවලට අනනුකූල බවට ද;

(iii) 3(ආ), 4(1), 4(2), 4(3), 4(4), 4(6), 5(1), 5(2), 8(2), 8(3), 8(4)(අ), 8(4)(ආ), 8(5), 8(6), 11, 16(6), 20(1), 20(3), 21(1), 21(8), 29, 30(1), 30(2), 31(1), 31(2), 34(1), 34(2), 38(1), 38(2), 38(3)(අ) සහ 38(4) වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3, 43(1) සහ 43(3) ව්‍යවස්ථාවලට අනනුකූල බවටද, එකී වගන්ති දැනට පවතින ආකාරයෙන්ම සම්මත කිරීම සඳහා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව විශේෂ බහුතර ඡන්දයකින් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව ජනමත විචාරණයකින් ජනතාව විසින් අනුමත කිරීම අවශ්‍ය බවට ද;

(iv) 9(3) වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යස්ථාවට අනනුකූල බවට; සහ

(v) මෙම පනත යටතේ ලියාපදිංචි වන විවිධ ඉංජිනේරු වෘත්තිකයන්ගේ කාර්යභාරය, වගකීම් හා ප්‍රවීණත්වය නිර්ණය කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ 39(2) (ඉ) වගන්තියේ, ඇතුළත් නොවන බව ද, එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යස්ථාව උල්ලංඝනය වන බවට ද,

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

තවදුරටත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ දැක්වෙන පරිදි එකී වගන්ති සංශෝධනය කළහොත් ඒවායේ අනනුකූලතාවයන් ඉවත්වනු ඇති බවටද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරමි.